*සැ. යු.* - 2018.08.10 දින පළ වූ අංක 2,084 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,085 - 2018 අගෝස්තු මස 17 වැනි සිකුරාදා - 2018.08.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1242 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1257 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1262 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

සැ. යු. - මුදල් පනත් කෙටුම්පත 2018 අගෝස්තු මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 සැප්තැම්බර් මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## බියගම ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

01. බියගම ප්‍රාදේශිය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාළ සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) |
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු III (ප්‍රාථමික අර්ධ ශිල්පීය) | 02 | PL 2 - 2016 රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 (රා.ප.ච. 03/2016 අනුව) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් විය යුතුය. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් විය යුතුය. | *වෘත්තීය සුදුසුකම් :* ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි.) *පළපුරුද්ද :* පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති, සේවා කාලය වසර 05ක් සපුරා ඇති, අදාල කාර්යක්ෂමතා කඩඉම සමත්, වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයකු විය යුතුය. | *වෘත්තීය සුදුසුකම්* ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි.) |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, තනතුරට අදාළ ප්‍රායෝගික දැනුම, කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය යනාදිය සලකා බලනු අතර එහිදී වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙලට අනුව බඳවා ගනු ලැබේ.

03. *වයස* .- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු අවු. 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

04. *වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්කරු ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ග්‍රාම නිලධාරි/ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඩුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.

(vi) අවශ්‍ය වෙතොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් තැබීමට සූදානම් විය යුතුය.

05. *පොදු කොන්දේසි :-*

(i) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර මනා පෞරුෂයකින් යුක්ත විය යුතුය,

(ii) මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.),

(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය,

(iv) පරිවාස කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ,

(v) මුල් පත්වීම් දින සිට වසර 3ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය,

(vi) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය,

(vii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි,

(viii) බඳවා ගැනීමෙන් පසුව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් ව්‍යාජ හෝ අසත්‍ය බවට තහවුරු වුවහොත් වෙනත් කිසිම දැනුම්දීමකින් තොරව පත්වීම අවසන් කරනු ලැබේ,

(ix) මීට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

06. *අයදුම්පත් :-* අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කර ගත් අයදුම්පත් 2018.08.31 වැනි දිනට පෙර "ලේකම්, බියගම ප්‍රාදේශීය සභාව, දෙල්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අයදුම් කරන තනතුර" සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳ වගකියනු නොලැබේ.

07. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමග පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේදී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,

*(ආ)* අධ්‍යාපන සහතිකය,

*(ඇ)* ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය,

*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, (එකක් පදිංචි වසමේ ග්‍රාම සේවා නිලධාරිගෙන්)

*(ඊ)* වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,

*(උ)* දැනටමත් සේවයේ යෙදෙන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පරිපාටි, ව්‍යවස්ථා සංශෝධනයවීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීමද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම්, සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල බියගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන්නේය.

වසන්ති වික්‍රමරත්න,
ලේකම්,
බියගම ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ අගෝස්තු 02 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***බියගම ප්‍රාදේශීය සභාව***

1. අයදුම්කරුගේ නම/ (මුලකුරු සමග) :——————————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
2. තැපැල් ලිපිනය:——————————————. දු.ක. අංකය
3. උපන් දිනය : අවුරුද්ද :——————. මාසය:—————— දිනය:——————
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු:—————— මාස :—————— දින:——————
5. විවාහක/ අවිවාහක බව :——————————————.
6. ජාතිය :——————————————. :
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග :——————————————.
8. අධ්‍යාපන සුදුසුකම් :——————————————.
9. වෘත්තීය සුදුසුකම් :——————————————.
10. පළපුරුද්ද : ආයතනය තනතුර සේවා කාලය

    —————— —————— ——————

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :
    (i) දැනට දරන තනතුර :——————————————.
    (ii) එම තනතුරට පත්වූ දිනය :——————————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/පදනම මතද) :——————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

08-675

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංක | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | බරවාහන ක්‍රියාකරු | 01 | PL3 - 2016 | රු. 25,790-10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 (මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වැනි දින සිට වන අතර, 3/ 2016 චක්‍රලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.) | <u>*බාහිර අයදුම්කරුවන් සඳහා :*</u><br><br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් වත් සමත් විය යුතුය.<br><br><u>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*</u><br><br>(ආ) දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br><br>මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම් / ආදේශක / කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br><br>*ශිල්පීය නිපුණතා / ප්‍රවීනතා හා පළපුරුද්ද :-*<br><br>තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරනලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබීම. (A පන්තියේ රියදුරු බලපත්‍රයක් ) හා මෙම තනතුර සඳහා තිබිය යුතු පළපුරුද්ද ලෙස අයි.ටී.ඒ.ටී. (I.T.A.T.) සහතිකය ලබා තිබීම හා බර වාහන රියදුරෙකු වශයෙන් වසර 05 ක පළපුරුද්දක් තිබීම. |

| අනු. අංක | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 02 | විදුලි කාර්මික | 01 | PL3 - 2016 | රු. 25,790-10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990/- (මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වැනි දින සිට වන අතර, 3/ 2016 චක්‍රලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.) | <u>බාහිර අයදුම්කරුවන් සඳහා</u><br><br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05 ක් වත් සමත් විය යුතුය.<br><br><u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u><br><br>(ආ) දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br><br>මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම් / ආදේශක / කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් අදාළ වේ.<br><br>*ශිල්පීය නිපුණතා / ප්‍රවීනතා හා පළපුරුද්ද :-*<br><br>තනතුරේ කාර්යභාරයට අදාළව තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික වෘත්තීය පුහුණු ආයතන යකින් නිකුත් කරන N.V.Q. 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම. (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.) |

| අනු. අංක | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 03 | ඖෂධ සංයෝජක | 01 | PL2 - 2016 | රු. 25,250-10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු.38,450<br><br>(මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වන දින සිට වන අතර, 3/ 2016 චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.) | *<u>බාහිර අයදුම්කරුවන් සඳහා :</u>*<br><br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයක් හැර)<br><br>*<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :</u>*<br><br>(ආ) දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වීම.<br><br>මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා අනියම් / ආදේශක / කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br><br>*ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා හා පළපුරුද්ද :-*<br><br>*අවශ්‍ය ශිල්පීය නිපුණතා/ප්‍රවීනතා :*<br><br>තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N.V.Q. 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම<br><br>*පළපුරුද්ද :*<br><br>අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 2 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

| අනු. අංක | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 04 | කාර්යාල කාර්ය සහයක | 01 | PL1 - 2016 | රු. 24,250-10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු.36,410<br><br>(මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වන දින සිට වන අතර, 3/ 2016 චක්‍රලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.) | (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) ක් වත් සමත් වී තිබිය යුතුය.<br>(වෛකල්පිත විෂයන් හැර)<br><br>(ආ) මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම් / ආදේශක / කොන්ත්‍රාක් පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |
| 05 | සෞඛ්‍ය කම්කරු | 02 | PL1 - 2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු. 36,410<br><br>(මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වන දින සිට වන අතර, 3/ 2016 චක්‍රලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.) | (අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) ක් වත් සමත් වී තිබිය යුතුය.<br>(වෛකල්පිත විෂයන් හැර)<br><br>(ආ) මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම් / ආදේශක / කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |
| 06 | වැඩ / ක්ෂේත්‍ර කම්කරු | 02 | PL1 - 2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු.36,410<br>(මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වන දින සිට වන අතර, 3/ 2016 චක්‍රලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් දෙකක් (02) ක් වත් සමත් වී තිබිය යුතු ය.<br>(වෛකල්පිත විෂයන් හැර)<br><br>(ආ) මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම් / ආදේශක / කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

02. ඉහත සඳහන් සියලු තනතුරු වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව පාලනය වේ.

03. *වයස* :- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අයෙකු විය යුතුය. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන්ට ද, මෙම ප්‍රාදේශීය සභාවේ අනියම් / ආදේශක / කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට ද, ඔවුන්ට පමණක් පෞද්ගලික වන සේ උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

04. *වෙනත් කොන්දේසි* :-

i. සෑම තනතුරකටම බඳවා ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ 11 වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.,
ii. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය,
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක් තුළ නාත්තන්ඩිය ප්‍රාදෙශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය ,
iv. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුත් අයෙක් විය යුතුය.,
v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

05. *පත්වීම් ස්වභාවය* :-

1. මෙම තනතුර ස්ථිරය. රජයේ සේවකයින් සඳහා 2016 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට රජය විසික් තීරණය කරනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය ඔබට අදාළ වනු ඇත. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

06. තනතුර සඳහා ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.09.05 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව, නාත්තන්ඩිය. " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

07. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

08. අයදුම්පත්‍රය පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය,
ii. ජාතික හැඳුනුම්පත,
iii. අධ්‍යාපන සහතික,
iv. ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරී සහතිකය),
v. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරියාගේ විය යුතුය),
vi. වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික, සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

09. *බඳවා ගැනීමේ ක්‍රමය* :

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත බඳවා ගැනීම් සිදු කෙරේ. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් සේවය කරන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වනු ඇත.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

කේ. පී. චන්දන කුමාර,
ලේකම්, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව,
නාත්තන්ඩිය.

2018 ජූලි මස 31 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ....................................................තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :——————————————.
02. ලිපිනය:——————————————.
03. දුරකතන අංකය:——————————————.
04. උපන් දිනය : වර්ෂය:———— මාසය :———— දිනය :————
05. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————.
06. ජාතිය ::——————————————.
07. විවාහක / අවිවාහක බව :——————————————.
08. ................................... වැනි දිනට වයස :————————
වර්ෂ :———— මාස :———— දින :————
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද :————
එසේ නම් පරම්පරාවෙන් ද / ලියාපදිංචියෙන් ද :——————————————.
10. ස්ත්‍රී / පුරුෂ භාවය:——————————————.
11. අධ්‍යාපන සුදුසුකම්:——————————————.
(පිටපත් අමුණා එවිය යුතුය.)
12. වෙනත් සුදුසුකම්:——————————————.
13. පළපුරුද්ද :——————————————.
14. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාල සීමාව
———— සිට ———— දක්වා
15. පෙර සේවය කර ඇති ස්ථාන :——————————————.
16. යම්කිසි සාපරාධි වරදකට කෙදිනක හෝ උසාවියක වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර ::————
——————————.

මෙම ඉල්ලුම් පතෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි වන අතර, යම් හෙයකින් මා සාවද්‍ය තොරතුරක් සපයා ඇත්නම් පත්වීම් ලබා දීමෙන් අනතුරුව නිසි වන්දියකින් තොරව මා සේවයෙන් ඉවත් කළ හැකි බව ද ඊට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර ලබා ගැනීම සඳහා මම සුදුස්සෙකු නොවන බවද මම දනිමි. අයදුම්පත් කැඳවීමේ දැන්වීමේ සඳහන් කරුණු-වලට එකඟවන බවත් මෙයින් සහතික කරමි.

පහත සඳහන් ලිපි ලේඛනවල ඡායා පිටපත් මෙයට අමුණා ඇත.

i. උප්පැන්න සහතිකය,
ii. අධ්‍යාපන සහතික,
iii. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
iv. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
v. ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිළධාරී සහතිකය),
vi. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————.

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතනයේ ප්‍රධානියාගේ සහතිකය.*

ඉහත අයදුම්කරු —————————— දින සිට මෙම ආයතනයේ —————————— වශයෙන් සේවය කරන බවත්, ඔහු/ ඇය විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මෙයින් සහතික කරමි.

——————————.
අත්සන.

දිනය :——————————

08 - 647

## වත්තේගම නගර සභාව

### මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාව සඳහා රියදුරු/කාර්යාල කාර්ය සහායක/පුස්තකාල සහායක/සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති වත්තේගම නගර සභා සීමාව හා පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2018.09.19 දින හෝ ඊට පෙර "ලේකම්, වත්තේගම නගර සභාව වත්තේගම" ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ වත්තේගම නගර සභාවේ (ඉල්ලුම්කරන තනතුර) සඳහා අයදුම්පත්‍රය යනුවෙන් සඳහන් කළ යුතුය. වත්තේගම නගර සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, ආදේශක, සේවකයින්ට හා නගර සීමාව තුළ පදිංචිකරුවන් වෙත ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* |
|---|---|
| රියදුරු III පන්තිය | 01 |
| කාර්යාල කාර්ය සහායක III පන්තිය | 01 |
| පුස්තකාල සහායක III පන්තිය | 01 |
| සෞඛ්‍ය කම්කරු III පන්තිය | 01 |

රියදුරු තනතුරට බඳවා ගැනීම සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

01. බඳවා ගැනීමේ ක්‍රමය

1.1 බඳවා ගන්නා අනුපාතය

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

1.2 විවෘත බඳවා ගැනීම

1.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

1.2.2 සුදුසුකම් :

1.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

1.2.2.2 වෘත්තීය සුදුසුකම් :
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ එක් එක් තනතුරු සඳහා අදාළ වන බාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.
B1, B, C1, C, CE, D1, D, G1, G

1.2.2.3 පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 3ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

1.2.2.4 කායික සුදුසුකම් :

I. සෑම අපේක්ෂකයෙකුටම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05යි අඟල් 2 1/2 ක විය යුතුය.

1.2.2.5 වෙනත් :

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරු අදළ පළාත් පාලන බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III. මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.
IV. බඳවා ගැනීමට අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.2.3 වයස :

1.2.3.1 අවම සීමාව : අවුරුදු 18 යි
1.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 යි

1.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

බඳවා ගැනීමේ ක්‍රමය ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළ ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

1.2.4.1 ලිඛිත විභාගය :

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් හෝ බලයලත් නිලධාරියෙකු පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

1.2.4.2 වෘත්තීය පරීක්ෂණය :

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහාමාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

1.3 සීමිත බඳවා ගැනීම් :

දැනටමත් අදළ පළාත් පාලන ආයතනයේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයන් සඳහා අදළ වේ.

1.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

1.3.2 සුදුසුකම් :

1.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍යපෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

1.3.2.2 වෘත්තීය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ එක් එක් තනතුරු සඳහා අදළ වන බාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

1.3.2.3 පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 3ක පළපුරුද්ද ලබා තිබීම . (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

1.3.2.4 කායික සුදුසුකම් :

I. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05යි අඟල් 2 1/2ක් විය යුතුය.

1.3.2.5 වෙනත් :

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරු අදළ පළාත් පාලන බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III. මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.
IV. බඳවා ගැනීම අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.3.3 වයස :

1.3.3.1 අවම සීමාව : අවුරුදු 18යි

1.3.3.2 උපරිම සීමාව :

අදළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

1.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර්රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබා ගත යුතුය.

1.3.4.1 ව්‍යුහගත පරීක්ෂණය :

1.3.4.1.2 ලකුණු ලබා දෙන ක්‍රමය :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගන්නා ලැබේ. |
| 2. මහමාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

අදාළ වැටුප් ක්‍රමය :

රා.ප.ච. 3/2016 රු. 25,790 - 270 x 10 - 300 x 10 - 330 x 10 - 350 x 12 - රු. 38,990 (2018 වර්ෂය සඳහා ආරම්භක වැටුප් රු. 20,462.00)

02. අනෙකුත් තනතුරු සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් (ශිල්පීය නොවන)

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| කාර්යාල කාර්ය සහායක III පන්තිය | 01 | රා.ප.ච. 3/2016 රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 34,410 (2018 වර්ෂය සඳහා ආරම්භක වැටුප් රු. 19,242) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් අවම වශයෙන් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. මින් විෂයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. |
| පුස්තකාල සහායක III පන්තිය | 01 | රා.ප.ච. 3/2016 රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 34,410 (2018 වර්ෂය සඳහා ආරම්භක වැටුප් රු. 19,242) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. පුහුණු ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| සෞඛ්‍ය කම්කරු III පන්තිය | 01 | රා.ප.ච. 3/2016 රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 (2018 වර්ෂය සඳහා ආරම්භක වැටුප් රු. 19,242) කි | -එම-<br>(සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවේදී 5 ශ්‍රේණිය සමත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ලැබේ.) |

3. සේවයට බඳවා ගැනීම අදාළ පළාත් පාලන ආයතනයේ පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

*අනෙකුත් තනතුරුවලට බඳවා ගැනීමේ ක්‍රමය :*

මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ. තවද වැන්දඹු හා වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු වේ. මේ සම්බන්ධව රජය විසින් වරින් වර නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.
- එසේම රාජ්‍ය සේවා පත් කිරීම් අදළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
- රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කල හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතුයි.
- තෝරාගනු ලබන්නේ තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුල වැඩ හැසිරීම, පැමිණීම සතුටුදායක තත්වයක නොමැති වුවහොත් ඉවත් කරනු ලැබේ.
- බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*වෙනත් පොදු කොන්දේසි :*

- ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අදාළ නගර සභා/ප්‍රාදේශීය සභා සීමාවන් තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
- අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුලත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
- දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වත්තේගම නගර සීමාව තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමිනාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් සනාථ කළ යුතුය.)
- රජයේ හෝ පලාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුල වරදකට (අවවාද කිරීම හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද මෙම කාලය තුළ යෙදුනු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබා ගත්තා වූද සතුටු දයක සේවා කාලයක් තිබිය යුතුය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දයක විය යුතුය.
- වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අයදුම්කරු ත්‍රිවිධ හමුදව හා ආරක්ෂක සේවයේ නිරත වී සිට විධිමත් පරිදි සේවයෙන් මුද නොහැරී අය නොවිය යුතුය.
- මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, මධ්‍යම පළාත් සභාව හෝ වත්තේගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකුලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
- කිසිදු තනතුරක් සඳහා පූජ්‍ය/පූජක පක්ෂයේ අයදුම්කරුවෙකු නොවිය යුතුය.
- මෙම බඳවා ගැනීමේ නිවේදනය විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද වත්තේගම නගර සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

*අයදුම්කළ යුතු ආකාරය :*

මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් සමග 2018.09.19 දිනට ප්‍රථම මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික හා වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික;
3. පදිංචිය පිළිබඳව ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළයුතුය;
4. මෑතකදී ලබා ගත් චරිත සහතිකය.

පී. එස්. බී. මඩුගල්ලේ,
ලේකම්,
වත්තේගම නගර සභාව.

2018 අගෝස්තු මස 06 වැනි දින,
වත්තේගම නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

***වත්තේගම නගර සභාව***

*.......................................... තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :—————————————.
මුලකුරු වලින් හැඳින්වෙන නම්
02. ස්ථිර ලිපිනය:—————————————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:—————————————.
05. උපන් දිනය : වර්ෂය:——————— මාසය :——————— දිනය :———————
06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :—————————————.
07. ස්ත්‍රී / පුරුෂ භාවය:—————————————.
08. විවාහක / අවිවාහක බව :—————————————.
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් වන්නේ උපතින්ද / ලියාපදිංචි වීමෙන් ද යන වග:—————————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් ඇමිණිය යුතුය) :—————————————.

අ. පො. ස. (සා.පෙළ) විභාගය :

සමත් වර්ෂය :——————— විභාග අංකය :———————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3 | | 7. | |
| 4. | | 8. | |

11. (1) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :—————————————.
(2) වෘත්තීය සුදුසුකම් :—————————————.
(3) සේවා පළපුරුද්ද :—————————————.

12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර ස්ථිර/අනියම්/ තාවකාලික / කොන්ත්‍රාත්/ආදේශක ද යන වග. එම තනතුරට පත් වූ දිනය :———————.
13. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? එසේනම් ඒ පිළිබඳ විස්තර :

දිනය :——————— අයදුම්කරුගේ අත්සන.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්රුවන් සඳහා ආයතන ප්‍රධානීන්ගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ....................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත්‍ර නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :———————

(නිල මුද්‍රාව තැබිය යුතුය.)

08-783

# පළාත් පාලන නිවේදන

## මහනුවර මහ නගර සභාවේ මහජනාධාර කමිටුව

දරිද්‍ර නීති ආඥාපනතේ 368 පරිච්ඡේදයේ 12(2) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව මහනුවර මහනගර සභාවේ මහජනාධාර කමිටුවේ සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් වූවන් 2018.05.25 දින සිට 2022.05.25 දින දක්වා කාල සීමාව සඳහා පත් කරන බව මෙයින් දන්වමි.

| *අනු. අංකය* | *නම* | *ලිපිනය* |
| --- | --- | --- |
| 01. | ජී. ජී. ද සිල්වා මඩපාත මහතා | අංක 455, ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත. මහනුවර. |
| 02. | ඒ. එල්. එම්. නුහුමාන් මහතා | අංක 8/1, වැව පාර, කටුකැලේ, මහනුවර. |
| 03. | යූ. බී. ඒකනායක මහතා | ශ්‍රී වෛශාඛ්‍යදාන සමිතිය, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මාවත, අංක 29, මහනුවර. |
| 04. | යූ. එම්. කුමුදු පුෂ්පා කුමාරි අබේරත්න මිය | අංක 95 බී, ධර්මාශෝක මාවත, අරුප්පල, මහනුවර. |
| 05. | රාජිකා හේරත් මිය | සීතා මෝටර්ස්, ඩී. එස්. සේනානායක වීදිය, මහනුවර. |
| 06. | නුවර හේවගේ සුමනලතා මිය | අංක 4/67, නාගස්තැන්න, මහනුවර. |

බන්දුල එස්. බී. යාලෙගම,
මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,
සමාජ සුභසාධන සහ පරිවාස හා
ළමාරක්ෂක සේවා අමාත්‍ය.

2018 ජූලි මස 17 වැනි දින.

08-570

---

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (i) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් 2018.06.21 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තියේ (i) වන උප වගන්තියේ (අ) ඡේදයේ සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වන වගන්තියේ (i) වන උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015.08.31 වැනි දින දරන අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම, වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ආදාහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම අධීක්ෂණය හා ගාස්තු අය කිරීම

සඳහා වන යෝජනා සහිත සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට ඉහත පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (i) වන උප වගන්තිය යටතේ පිළිගැනීමට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

රොෂාන් නිලන්ත ප්‍රනාන්දු,
සභාපති,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2018 ජූනි මස 21 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

08-646

---

**නාරම්මල ප්‍රාදේශීය සභාව**

මැටියගනේ ක්‍රිස්තියානි පල්ලිය පොදු සුසාන භූමිය ඉදිකිරීම සඳහා විරෝධතා කැඳවීම

නාරම්මල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1053 කිවුල්ගල්ල වසමේ මැටියගනේ ග්‍රාමයේ පිහිටි මැටියගනේ ක්‍රිස්තියානි පල්ලිය සතු ඉඩම තුළ ක්‍රිස්තියානි ආගමික වත්පිළිවෙත් අනුව භූමදාන කටයුතු සිදු කිරීමට සුසාන භූමියක් සකස් කර දෙන ලෙස සිරිගල මීසම භාර පියතුමා හා ප්‍රදේශවාසීන් ඉල්ලීම් කර ඇති බැවින් පිඹුරු අංක 12220 දරන පිඹුරුපතින් හා ඔප්පු අංක 13081 දරන තෑගි ඔප්පුවෙන් සුසාන භූමිය ඉදිකිරීම සඳහා පර්. 15ක ඉඩම් කොටසක් නාරම්මල ප්‍රාදේශීය සභාව වෙත පවරා ඇති බැවින් 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි ආඥාපනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2018.07.03 වැනි දින රැස්වූ නාරම්මල ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් යෝජනා අංක 3.5 යටතේ යෝජනා සම්මත කර ඇත.

ඒ අනුව ඉහත සුසාන භූමිය ඉදිකිරීම සම්බන්ධ, යම් විරෝධතාවක් ඇතොත් මෙම දැන්වීම පළ වූ දින සිට දින 30ක් දක්වා කාල සීමාව තුළ මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. සුමනසිරි,
සභාපති,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

08-622/1

---

**නාරම්මල ප්‍රාදේශීය සභාව**

පහමුනේ ඇත්ගාලවත්ත/ දිවුල්ගොල්ල පොදු සුසාන භූමිය ඉදිකිරීම සඳහා විරෝධතා කැඳවීම

නාරම්මල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1073 පහමුනේ ග්‍රාම නිලධාරී වසම තුළ, ප්‍රසන්න ඔබේසේකර මහතා සතු ඇත්ගාලවත්ත නම් පෞද්ගලික ඉඩම තුළ පිහිටි පැරණි පොදු සුසාන භූමිය වෙනුවට එම ඉඩමේම වෙනත් ස්ථානයකින් ඔප්පු අංක 9466 දරන තෑගි ඔප්පුවෙන් පර්. 80.02ක් හා පිවිසුම් මාර්ගය සඳහා පර්. 17.8ක් ප්‍රමාණවත් නව සුසාන භූමිය ඉදි කිරීම සඳහා ප්‍රාදේශීය සභාව වෙත ප්‍රදානය කර ඇති බැවින් 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි ආඥාපනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2018.07.03 වැනි දින රැස්වූ නාරම්මල ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් යෝජනා අංක 3.4 යටතේ යෝජනා සම්මත කර ඇත.

ඒ අනුව ඉහත සුසාන භූමිය ඉදිකිරීම සම්බන්ද, යම් විරෝධතාවක් ඇතොත් මෙම දැන්වීම පළවූ දින සිට දින 30ක් දක්වා කාල සීමාව තුළ මා වෙත ඉදිරිපත් කරන මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. සුමනසිරි,
සභාපති,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

08-622/2

## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

මහජන පුස්තකාලය සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 2005.02.18 වැනි දින අංක 1381 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පළාත් සභා නිවේදනය යටතේ පල කරන ලද්දා වූ ප්‍රාදේශීය සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය සමග කියවිය යුතු 122 වගන්තිය මගින් ප්‍රාදේශීය සභා වලට පැවරී ඇති බලතල යටතේ එම අතුරු ව්‍යවස්ථාව ඉහත කී දෙවන වගන්තියෙහි සඳහන් විධි විධානවලට යටත්ව පිළිගැනීමට 2018 මැයි මස 22 වැනි දින රැස් වූ වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් ගෙන ඇති සභා තීරණය, 2018 ජූනි මස 01 වැනි දින සිට පිළිගෙන ක්‍රියාත්මක කරන බව මෙයින් නිවේදනය කරමි.

උදේනි ප්‍රියංග අතුකෝරල,
සභාපති,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව.

08-591

---

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/ මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/ මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කේ. ඒ. නිහාල් සෙනවිරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2018 ජූලි මස 24 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මාර්ගයේ නම : බෝධි මාවතෙන් ගැවිලිපිටිය ප්‍රධාන මාර්ගය

මාර්ගයේ ආරම්භය : ඩී. උපාලි මයා හිමිකම් කියන සහ එස්. ජී. ආර්. ආර්. කුමාරිහාමි හිමිකම් කියන වතුරපාළුව ඉඩම

මාර්ගයේ අවසානය : එම්. අතුල කුමාර මයා හිමිකම් කියන වතුරපාළුව ඉඩම

ග්‍රාම නිලධාරි වසම : ගැවිලිපිටිය

මාර්ගයේ දිග හා පළල : දිග මීටර් 125 පළල : අඩි 08


*මාර්ගයේ ආරම්භය සිට අවසානය දක්වා වම් පස ඉඩම්හිමියන්ගේ නම් :*

| *නම* | *ඉඩමේ නම* |
|---|---|
| බී. උපාලි මයා (ආර්. ඒ. ඩී. රණසිංහ මැණිකේ මිය) | වතුරපාළුව ඉඩම |
| එම්. අනුලා විජේවර්ධන මිය | වතුරපාළුව ඉඩම |

*මාර්ගයේ ආරම්භය සිට අවසානය දක්වා දකුණු පස ඉඩම්හිමියන්ගේ නම් :*

| *නම* | *ඉඩමේ නම* |
|---|---|
| එස්. පී. ආර්. ආර්. කුමාරිහාමි මිය | වතුරපාළුව ඉඩම |
| එච්. ජී. විමලසේන මයා (ආර්. ඩී. චන්ද්‍රිකා පද්මිණී මිය) | වතුරපාළුව ඉඩම |
| එල්. අතුල කුමාර මයා (එල්. පියදාස මයා) | වතුරපාළුව ඉඩම |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2009.12.24 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 6385 දරන පිඹුර අනුව වේ.




| කට්ටි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | නිරවුල් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0347 | 00 | 0 | 13.72 | 125.00 | 08 | |

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## රිදීගම ප්‍රාදේශීය සභාව

### 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2016.12.31 රු. ශත | 2017.12.31 රු. ශත |
|---|---|---|---|
| *මෙහෙයුම් අයභාරය :* | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්ථන | 1 | 41,359,715.14 | 44,111,278.70 |
| වෙනත් අයභාර | 2 | 34,519,901.84 | 36,447,710.27 |
| මුළු මෙහෙයුම් අයභාරය | | 75,879,616.98 | 80,558,988.97 |
| *මෙහෙයුම් වියදම :* | | | |
| පුනරාවර්ථන වියදම | 3 | 62,288,271.76 | 62,831,510.05 |
| මුළු මෙහෙයුම් වියදම | | 62,288,271.76 | 62,831,510.05 |
| වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය | | 13,591,345.22 | 17,727,478.92 |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 29,361,024.07 | 22,374,279.61 |
| ප්‍රාග්ධන වියදම් | 5 | 42,902,805.64 | 32,696,743.38 |
| වර්ෂය සඳහා වන අතිරික්තය/ඌණතාවය | | 49,563.65 | 7,405,015.15 |

### 2017 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2016.12.31 රු. ශත | 2017.12.31 රු. ශත |
|---|---|---|---|
| *වත්කම් :* | | | |
| *ජංගම නොවන වත්කම් :* | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 6 | 190,954,602.11 | 195,713,155.94 |
| ජංගම වත්කම් | | | |
| තොග | 7 | 894,348.98 | 1,042,967.00 |
| සේවක ණය හා අත්තිකාරම් | 8 | 4,131,931.76 | 4,575,419.85 |
| ලැබිය යුතු දෑ | 9 | 70,281,804.02 | 64,910,698.54 |
| ආයෝජන (පෙර ගෙවුම්) | 10 | 264,640.00 | 336,145.00 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 17,533,473.61 | 21,966,985.18 |
| මුළු වත්කම් | | 284,060,800.48 | 288,545,371.51 |
| *වගකීම් :* | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 6,022,774.84 | 5,513,589.03 |
| ජංගම වගකීම් | 13 | 52,654,137.88 | 43,843,357.84 |
| හිමිකම් | 14 | 225,383,887.76 | 239,188.424.64 |
| මුළු හිමිකම් සහ වගකීම් | | 284,060,800.48 | 288,545,371.51 |

ජේ. ඒ. අජිත් කුමාරසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
රිදීගම

08-626

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.